# 5

# මුල් බ්‍රාහ්මී අක්ෂර අයත් කාලය පිළිබඳ කාංසාව

රාජ් සෝමදේව[1]

ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ක්ෂිතිජය ගොඩ නැගීමට ඉවහල් වන ප්‍රධාන මූලාශ්‍රයක් වන්නේ මුල් බ්‍රාහ්මී අක්ෂරවලින් රචනා කර තිබෙන දහස් ගණනක් වූ කෙටි සෙල්ලිපි වාර්තායි. ඒවායේ අන්තර්ගත තොරතුරු මෙරට සමකාලීන සමාජ-දේශපාලනික සහ බෞද්ධාගමික ඉතිහාසය ගොඩ නැගීමට ඉතිහාසඥයින් සහ පුරාවිද්‍යාඥයින් විසින් ඉවහල් කර ගන්නා මුල් පෙළේ මූලාශ්‍රයක් බවට පත්ව තිබේ. එහෙයින් මෙම සෙල්ලිපි ලියා ඇති අක්ෂර මුල්වරට භාවිතයට පැමිණි කාලය සම්බන්ධයෙන් වන ස්ථාවරය මෙරට ඉතිහාසයට අයත් මුල් අවධියේ ස්වරූපය පිළිබඳ ගොඩ නගන දැනුමේ එක් තීරණාත්මක නිර්ණායකයක් බවට පත් වේ. බ්‍රාහ්මී අක්ෂරවල ප්‍රභවය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළ පුරෝගාමීන් වන ජෝර්ජ් බියුලර්ගේ මතය වන්නේ බ්‍රාහ්මී අක්ෂර පද්ධතිය ඉන්දියාවට බාහිර මූලාශ්‍රයකින් පැමිණි එකක් බවයි. බියුලර් එය උතුරු සෙමිටික් මූලයකට සම්බන්ධ කිරීමට යෝජනා කරයි. උතුරු සෙමිටික් අක්ෂර ක්‍රිස්තු පූර්ව 1100 දී පමණ සිරියානු ප්‍රදේශයේ භාවිත වූ අක්ෂර පද්ධතියකි. උතුරු සෙමිටික සම්ප්‍රදායට අයත් ෆිනීෂියානු අක්ෂර පද්ධතිය සහ බ්‍රාහ්මී අක්ෂර පද්ධතිය අතර තිබෙන රූපික සබඳතා බියුලර් විසින් අවධාරණය කරන ලදී. මේ අදහස තියුණු ලෙස විවේචනය කරන ගෞරි ශන්කර් ඕජාගේ මතය වන්නේ එය ඉන්දු-නිම්න සංකේත පද්ධතියෙන් විකාශය වූවක් ලෙසය. ඉන්දීය පුරාවිද්‍යාඥයෙකු වූ බී.බී. ලාල් විසින් රචිත දීර්ඝ ලිපියක මේ අදහස තහවුරු කිරීමට පුළුල් ලෙස සාක්ෂි උපුටා දැක්වීමට වෑයම් කර තිබේ.

[1] ශාස්ත්‍රවේදී (පුරාවිද්‍යා ගෞරව), දර්ශනපති, දර්ශනසූරි
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්ව විද්‍යාලය, අංක 407, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.
අධිසාමාජික, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සංගමය
Email: rajsomadeva@gmail.com

බ්‍රාහ්මී අක්ෂරවල ප්‍රභවය නිර්ණය කිරීමට බලපාන ප්‍රධාන කාරණා කිහිපයක් වෙත ඒ ගැන අවධානය යොමු කළ මෑතකාලීන විද්වතුන් කිහිපදෙනෙකුගේ විමසිල්ල යොමුව තිබේ. ඔස්කාර් වොන් හිනුබර්, හැරී ෆොල්ක්, ජෙරාඩ් ෆුස්මාන්, කෙනත් ආර්. නෝමන් ඒ අතරින් ප්‍රමුඛත්වයට ගැනේ. මෙම පත්‍රිකාව මගින් ඒ අදහස් සමාලෝචනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී අක්ෂරවල මූල් අවස්ථාව දෙස නවමු ආකාරයෙන් බැලීමට ඉවහල් කර ගත හැකි ඇතැම් සාක්ෂි සාකච්ඡා කිරීමටත් නියමිතය.